**ගරු නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් පණිවුඩය**



වසරකට වරක් එළඹෙන ජනාවාස දිනය අප නැවතත් ඔක්තෝබර් මස ප්‍රථම සදු දින සමරමු. වාර්ෂිකව ලෝක ජනාවාස දිනය සමරනුයේ කිසියම් අර්ථාන්විත ජනාවාස විෂය ක්ෂේත්‍රය මුල්කොටයි. එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් ප්‍රකාශයට පත්කොට ඇති ආකාරයට මෙවර ජනාවාස දින තේමාව ජගත් ප්‍රජාවට බෙහෙවින් කාලෝචිත වේ. ***සහජීවන නගර*** යන තේමාව යටතේ මෙවර ජනාවාස දින සැමරුම තීරණය කිරීමත් සමගින් ක්‍රියාවට නැංවුනු ජනාවාස දින ක්‍රියාකාරී වැඩසටහන් තුළින් සැබෑ සහජීවනයක් ගොඩ නැගී තිබේ. නිවාස හා ජනාවාස ක්ෂෙත්‍රය සම්බන්ධ ශ්‍රී ලංකාවේ ප්‍රධානම අමාත්‍යාංශ දෙක වන නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය, නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය "***සහජීවන නගර***" තේමාව යටතේ ඒකාබද්ධ ජනාවාස වැඩසටහන දියත්කොට ඇත. මෙම අමාත්‍යාංශ ද්විත්වයට අයත් සියළු ආයතන සහ රාජ්‍ය ආයතන හා වෙනත් සංවිධාන පුද්ගලයින්ගේ සහායෙන් නාගරික ජනතාවගේ සහජීවනය අරමුණු කොට විවිධ ව්‍යාපෘති ක්‍රියාවට නංවා තිබේ.

මෙම ක්‍රියාකාරකම් උතුරු නැගෙනහිර ප්‍රදේශ ඇතුළු දිවයින පුරා ක්‍රියාවට නංවා ඇති අතර එහි සැබෑ ඵලදායිතාවය ප්‍රතිලාභින් විසින් භුක්තිවිදීම හුදෙක් එක් දිනකට පමණක් සීමා නොකොට ජනාවාස දිනට පෙර පුරා සතියක් එහි ප්‍රතිඵල භුක්ති විදීමට සැලැස්වීමෙන් එම ජනාවාස සංවර්ධන ක්‍රියාවලියේ ඇති හරවත් බව මනාව පෙනී යයි. එම කාලය තුළ ගමේත් නගරයේත්,වතුකරයේත් නව නිවාස ව්‍යාපෘති ඇරඹීම පවත්නා නිවාස ව්‍යාපෘති වැඩිදියුණුකිරීම ජනාවාසකරණය පිළිබඳ දැනුවත්කිරීම වැනි ඵලදායී කටයුතු දිවයින පුරා සිදුකෙරේ.

ජනාවාස දින සංවර්ධන කටයුතු තුළින් ජනතාව ලබන සහජීවනය වඩාත් ඵලදායී අයුරින් ක්‍රියාවට නංවා එය වඩාත් උත්කර්ෂවත් අයුරින් සැමරීම මෙවර ලෝක ජනාවාස දිනයේ තවත් එක් විශේෂත්වයකි. ඒ සඳහා කොළඹට තදාසන්නව පිහිටි " මොරටු පුරවරය" මෙවර ජනාවාස දින සැමරුම සඳහා කේන්ද්‍රගතකොට තිබේ. ගතවූ මාස කිහිපය තුළ මොරටුව නගරය සහ ඒ අවට සිදුවූ සංවර්ධන කාර්යයන් මෙම ජනාවාස දින සංවර්ධන ක්‍රියාවලියේ සුවිශේෂී අංගයන් ලෙස හදුන්වා දිය හැකිය.

එහි සාර්ථකත්වය සඳහා අපට නිරන්තරමග පෙන්වීම ලබාදුන් නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය ගරු ෆේරියල් අෂ්රොෆ් අමාත්‍ය තුමියට විශේෂ ස්තූතියක් පුදකළ යුතුවේ .නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා ලබාදුන් උපදේශකත්වය මෙහිදී විශේෂයෙන් සඳහන් කළයුතුවේ .තවද අප අමාත්‍යාංශයේ නිවාස අමාත්‍ය ගරු ගිතාංජන ගුණවර්ධන මැතිතුමන්ටත් සංවර්ධන අමාත්‍ය ගරු රෝහන දිසානායක මැතිතුමන්ටත් ඉඩම් සංවර්ධන අමාත්‍ය ගරු ජීවන් කුමාරතුංග මැතිතුමන්ටත්, මෙම ක්‍රියාදාමයේ සාර්ථක්තවය වෙනුවෙන් වැදගත් සහායක් ලබාදුන් මොරටුව නගරාධිපති ගරු සමන්ලාල් ප්‍රනාන්දු මැතිමන් ඇතුළු ජනාවාස දිනය සාර්ථක කරගැනිමට නන් අයුරින් දායකවූ සැමට මාගේ කෘතවේදීත්වය මෙයින් පුදකරමි.

**ඩබ්ලිව් බී ගනේගල**
**ලේකම්**
**නිවාස හා පොදු පහසුකම් අමාත්‍ය**